# උඩරට එළවළු නිෂ්පාදනයේ උච්චාවචනය කෙරෙහි බලපාන සාධක (ලීක්ස් වගාව ආශ්‍රයෙන්)

ආර්.එම්.පී.ජී. රාජපක්ෂ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තීරණය කරන ප්‍රධාන සාධකයක් ලෙස කෘෂිකර්මාන්තය දැක්විය හැකිය. ආර්යයන් ශ්‍රී ලංකාවට පැමිණීමත් සමගම දේශීය යැපුම් කෘෂිකර්මාන්තය මුල් කරගත් ආර්ථික ක්‍රමයක් පැවතුණි. මේ යටතේ වී වගාව මෙන්ම දේශීය එළවළු වගාවද රට තුළ සිදු විය. බ්‍රිතාන්‍යයන් මෙරටට ආක්‍රමණය වීමත් සමගම වැවිලි වගාව මෙන්ම නව එළවළු ප්‍රභේද වගාවද ආරම්භ විය. නව එළවළු වර්ග වගා කිරීම සඳහා සුදුසු දේශගුණයක් උඩරට ප්‍රදේශයේ පමණක් පැවති නිසා මාතලේ, මහනුවර, බදුල්ල හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක වල සීඝ්‍රයෙන් එළවළු වගාව ව්‍යාප්ත විය. ඒ අතුරින් වගාව සඳහා වැඩි වශයෙන් යොදා ගත්තේ නුවරඑළිය ප්‍රදේශයයි. මෙම ප්‍රදේශය තුළ ලීක්ස්, කැරට්, බෝංචි, අර්තාපල්, බීට්රූට්, නෝකෝල්, සලාද, ගෝවා, තක්කාලි, මාළු මිරිස්, රාබු ආදී බෝග රැසක් වගා කිරීම සිදු විය. වර්තමානය වන විට රටට එළවළු සපයන ප්‍රධාන ප්‍රදේශයක් බවට පත්ව ඇත. මෙම කරුණු අනුව පැහැදිලි වන්නේ උඩරට එළවළු නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනය තුළ ප්‍රධාන තැනක් ගන්නා බවයි. ඒ අනුව එළවළු නිෂ්පාදනය කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය වැදගත්ය. මෙහිදී අධ්‍යයනය සඳහා කාලය හා පිරිවැය සංරෝධකයන්ට යටත්ව ලීක්ස් වගාව පමණක් තෝරා ගන්නා ලදී. සාධක පිළිබඳ විග්‍රහය ප්‍රාථමික දත්ත ආශ්‍රයෙන් සිදු කර ඇත. අස්වැන්න කෙරෙහි සාධකයන්හි බලපෑම සරල ප්‍රතිපායන ආකෘති, බහුගුණ ප්‍රතිපායන ආකෘති, කල්පිත පරීක්ෂා ආදිය ඇසුරෙන් විමසා බලන ලදී. මෙම විග්‍රහයට අනුව පෙනී යන්නේ අස්වැන්න කෙරෙහි වැඩිම දායකත්වයක් සපයන සාධකය භූමිය බවත් පොහොර භාවිතයද සැලකිය යුතු මට්ටමකින් අස්වැන්න වැඩිවීම කෙරෙහි හේතු වන බවත්ය. තවද අස්වැන්න යෙදවුම් මත පමණක්ම තීරණය නොවන බවත් අස්වැන්න කෙරෙහි පාරිසරික විපර්යාසයන්ගේ බලපෑමක් ඇති බවත් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *කෘෂිකර්මාන්තය, එළවළු නිෂ්පාදනය, ප්‍රතිපායන විශ්ලේෂණය*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
ganga01@stu.kln.ac.lk